# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.11.01 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1970 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

**01. වෙඩි තබා පුද්ගලයෙකුට තුවාල සිදු කිරීමේ අපරාධයකට අවශ්‍යකර සිටි සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2025.10.31 වන දින මොරටුව පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත දමන පොලිස් වසමේ හිගුරාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර 2025.07.11 වන දින හිරණ පොලිස් වසමේදී පුද්ගලයෙකුට වෙඩි තබා තුවාල සිදු කිරීම හා පානදුර පොලිස් වසමේ පුද්ගලයෙකුට වෙඩි තබා ඝාතනය කිරීමට සැලසුම් කිරීම සම්බන්දයෙන් අවශ්‍යකර සිටි සැකකරුවෙකු හෙරොයින් ග්‍රෑම් 13 ක් සමඟ අත්අඩංගුවට ගෙන දමන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන හිගුරාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් දමන හා හිරණ පොලිස් ස්ථාන සහ පානදුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ටී56 ගිනි අවියක් සොයා ගැනීමක් - කෝප්පායි පොලිස් ස්ථානය.**

2025.10.31 වන දින දහවල් කාලයේදී කෝප්පායි පොලිස් වසමේ පිහිටි යාපනය විශ්ව විද්‍යාලයේ පුස්තකාල ගොඩනැගිල්ලෙහි වහලය පිළිසකර කිරීමේ කටයුතු සිදුකිරීමේ දී එහි තිබී ගිනි අවියක් හා එම උපකරණ හමුවී ඇති අතර ඒ සම්බන්ධව කෝප්පායි පොලිස් ස්ථානයට කරන ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

සිදුකරන ලද පරීක්ෂාවේදී එහි තිබී ටී56 වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් ගැම් 02 ක්, ටී56 පතරොම් 175ක්, මෙරට නිෂ්පාදිත බෝම්බ 03 ක් හා කල් ඉකුත් වූ සේලයින් බෝතල් 05 ක් ඇතුළු ප්‍රථමාධාර උපාංග හමුවී පොලිස් භාරයට ගෙන ඇත.

මේ සම්බන්ධව කෝප්පායි පොලිස් ස්ථානය මගින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයක් - අහුංගල්ල පොලිස් වසම.**

2025.10.31 වන දින උදෑසන කාලයේ අහුංගල්ල පොලිස් වසමේ පාතේගම ප්‍රදේශයේදී පුද්ගලික ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුද්ගලයෙකු විසින් කාන්තාවකට ගලකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට අහුංගල්ල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරාරිය වයස අවුරුදු 43 ක් වූ පාතේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු මරණකාරියගේ ඥාතියෙකු වන අතර ඝාතනයෙන් පසු සැකකරු පලාගොස් ඇති අතර මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අහුංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - ශ්‍රී පුර පොලිස් වසම.**

2025.10.31 වන දින දහවල් කාලයේ ශ්‍රී පුර පොලිස් වසමේ වැලිඔය සිංහපුර මාර්ගයේ සිංහපුර හන්දියේදී වැලිඔය දෙස සිට සිංහපුර දෙසට ධාවනය වූ යතුරුපැදියක් විරුද්ධ දිසාවෙන් පැමිණි ටිපර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු ශ්‍රී පුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු

මියගොස් ඇති අතර පසුපැදිකරුද වැඩිදුර ප්‍රතිකාර සඳහා වව්නියාව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුවන් අවුරුදු 28 හා 30 වයස්වල පසුවන වැලිඔය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීර වව්නියාව හා ශ්‍රී පුර රෝහල්වල මෘත ශරීරාගාරවල තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ශ්‍රී පුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2025.10.31 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර කුරුණෑගල මාර්ගයේ අළුත්වැව ප්‍රදේශයේදී තලාව දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ කාර් රථයක් පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කාර් රථයේ රියදුරුද තුවාල ලබා අනුරාධපුර රෝහලේ ප්‍රතිකාර ලබයි. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.

2025.10.31 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් වසමේ ගොංගාවෙල මාර්ගයේ බස්නැවතුම්පොල අසලදී මගී බස් රථයක් පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා මාතලේ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 95 ක් වූ කලුදෑවල, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**